# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# CHIEF SECRETARY'S OFFICE - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය" 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி மந்திரய", 32, ஸ்ரீமத் மார்க்கஸ் பெர்னாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi" Mandiraya, 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

මගේ අංකය / எனது இல / My No: 3/2/2/6/62
ඔබේ අංකය / உமது இல / Your No.:

ප්‍රධාන ලේකම් /பிரதம செயலாளர்/Chief Secretary
දුරකථන/தொலைபேசி /Telephone 2698409
ෆැක්ස් /பெக்ஸ் /Fax 2694667

පොදු/பொது/General
දුරකථන / தொலைபேசி / Telephone 2691665,2682868 2696027,2682869 2682870

දිනය / திகதி / Date: 2014.01.


**කෙටුම්පතයි**

<u>පළාත් සභා අධිකාරී/ව්‍යවස්ථාපිත ආයතනවල තනතුරු දරන්නන්ට</u>

<u>ඉන්ධන දීමනා නියම කිරීම.</u>

01. මහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2008.07.28 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 50 හි දැක්වෙන උපදෙස් සැලකිල්ලට ගෙන අනුයුක්ත කල නිල වාහන හිමිකම් ඇති පළාත් සභා අධිකාරී/ව්‍යවස්ථාපිත ආයතනවල පහත සඳහන් තනතුරු දරන්නන්ට පහත පරිදි මාසික ඉන්ධන දීමනාවක් ගෙවීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

| | හිමිකම් දරණ තනතුර | පෙට්‍රල්/ඩීසල් වාහන සඳහා මාසිකව අනුමත ඉන්ධන ප්‍රමාණය ලීටර | ඉන්ධන සඳහා අනුමත උපරිම මාසික දීමනාව |
|---|---|---|---|
| 01. | සභාපති | 170 | |
| 02. | සාමාන්‍යාධිකාරී/අධ්‍යක්ෂ | 140 | මසකට අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය × මාසයේ පළමු දිනට පවතින ඉන්ධන මිල |
| 03. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති තනතුරු සඳහා පමණි) | 120 | |

02. වෙන්කල නිල වාහන සඳහා හිමිකම් ලැබ ඇති තනතුරු දරන්නන් සංචිත වාහන භාවිතා නොකල යුතුය. සියළු තනතුරු දරන්නන් පළමුවන ඡේදයේ සඳහන්කර ඇති ඉන්ධන සීමා තුල සියළුම රාජකාරී අවශ්‍යතා සලසාගත යුතු අතර කාර්යාලයෙන් දුර බැහැර විශේෂ වූ රාජකාරී ගමන් සඳහා අතිරේක ඉන්ධන ලබාගත යුතුනම්, ඒ සඳහා අදාල අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු අතර, අමාත්‍යාංශ ලේකම් විසින් ඒ සඳහා අනුමැතිය පෞද්ගලිකවම ලබා දිය යුතු වේ. අතිරේක ඉන්ධන ඉල්ලුම් කිරීම සම්බන්ධයෙන් මීට යාකර ඇති ආකෘතිය භාවිතා කල යුතුය.

51

03. වෙන්කල නිල වාහන හිමිකම් ඇති තනතුරු දරන්නන්ගේ පෞද්ගලික ගමන් වෙනුවෙන් රියදුරන්ට අතිකාල දීමනා සහ සංයුක්ත දීමනා ගෙවීම අධිකාරියේ වැය බරක් නොවිය යුතුය. එම බර අදාල තනතුරු දරන්නා විසින් දැරිය යුතුය.

04. ඉන්ධන දීමනාවකට හිමිකම් ඇති, තනතුරු එකකට වැඩි ගණනක් දරණ නිලධාරියෙක් තම නිත්‍ය තනතුරු සඳහා නියම කර ඇති ඉන්ධන දීමනාව පමණක් ලබාගත යුතුය. කෙසේ නමුත් , අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අතිරේක ඉන්ධන ප්‍රමාණයක්, අතිරේක තනතුරකට අදාල රාජකාරි ගමන් සඳහා, එම තනතුරට නියමකර ඇති උපරිම සීමාවට යටත්ව ලබා ගත හැක. මෙසේ ලබාගත හැක්කේ අතිරේක එක් තනතුරක් සඳහා පමණි.

06. මසකට අධික කාලයක් වැටුප් රහිත විදෙස් හෝ දේශීය නිවාඩු ලබා සිටින නිලධාරියකුට නිල වාහනයක් භාවිතා කිරීමට හෝ රියදුරකුගේ සේවය ලබා ගැනීමට හිමිකමක් නැත. කෙසේ නමුත්, තමන්ගේ පාලනයෙන් තොර කාරණයක් නිසා, එනම් දීර්ඝ රෝගී තත්වයක් වැනි අවස්ථාවක් නිසා වැටුප් රහිත නිවාඩු ලබා සිටින තනතුරු දරන්නෙකුට මෙම පහසුකම් මසකට වඩා වැඩි කාලයක් ලබාදීම අධ්‍යක්ෂ මණ්ඩලයට අනුමත කල හැක.

07. ආයතනයෙන් සැපයෙන කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් කාර්යාලයේ සිට යාම ඒම සඳහා උපරිමය කිලෝමීටර් 50 කට සීමා විය යුතුය. කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැපයිය හැක්කේ මාණ්ඩලික නිලධාරීන්ට පමණි. අවම වශයෙන් මාණ්ඩලික නිලධාරීන් 03 දෙනෙකුවත් සිටිය යුතුය. ප්‍රමාණවත් වාහන සහ ප්‍රමාණවත් ප්‍රතිපාදන පවතිනම් පමණක් මෙම පහසුකම සැපයිය යුතුය. මෙම වාහනය රාත්‍රී කාලයේ නවතා තැබිය යුතු ආරක්ෂිත ස්ථානය අධ්‍යක්ෂවරයා/ සාමාන්‍යාධිකාරී විසින් තීරණය කල යුතුය.

08. එසේම මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන .................... දින සිට ක්‍රියාත්මක වන අතර, 2012.11.13 දිනැති ව්‍යාපාර චක්‍රලේඛ 1/2012 මෙදින සිට අවලංගුවන බව කාරුණිකව දන්වමි.

..............................
සුනිල් අබේවර්ධන,
ආණ්ඩුකාර ලේකම්.

..............................
එන්.බන්දුල ප්‍රේමකුමාර,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුල්‍ය).

..............................
ජේමන්ති සමරකෝන්,
සභා ලේකම්.

..............................
එන්.රණසිංහ,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)

..............................
පී.තෝමසිරි,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන)

..............................
චමිකා පතිරණ,
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන).

..............................
ආර්.එම්.එස්.බණ්ඩාරනායක,
සභාපති,
පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය.

50

# අතිරේක ඉන්ධන සඳහා වියදම් පියවීම/ප්‍රතිපූර්ණය කිරීම

1. තනතුරු දරන්නාගේ නම :-
2. තනතුර :-
3. අනුයුක්ත වාහනයේ අංකය :-
4. අනුයුක්ත වාහනයේ සාමාන්‍ය ඉන්ධන භාවිතය ලීටරයකට කි.මී. :-
5. මසකට හිමි උපරිම ඉන්ධන ප්‍රමාණය :-
6. මුදල :-
7. අතිරේක ඉන්ධනවලින් ගමන් කරන ලද හෝ ගමන් කිරීමට යෝජිත ස්ථාන හා දුර ප්‍රමාණය :-

| දිනය | පටන්ගත් ස්ථානය/ පටන් ගන්නා ස්ථානය | ගිය ස්ථාන / යාමට නියමිත ස්ථාන | දුර කි.මී. |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| එකතුව | | | |

8. ගමන සඳහා භාවිතා වූ හෝ අවශ්‍යවන ඉන්ධන ප්‍රමාණය ලීටර් :-
9. වැය වූ හෝ අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය සඳහා ඉල්ලුම් කරන මුදල :-
10. මෙම වර්ෂයේ මෙතෙක් ලබාගෙන ඇති අමතර ඉන්ධන ප්‍රමාණය :-

| මාසය | ලබාගත් ඉන්ධන ලීටර් ප්‍රමාණය | වටිනාකම | |
|---|---|---|---|
| | | රු. | ශත |
| ජනවාරි | | | |
| පෙබරවාරි | | | |
| මාර්තු | | | |
| අප්‍රේල් | | | |
| මැයි | | | |
| ජුනි | | | |
| ජූලි | | | |
| අගෝස්තු | | | |
| සැප්තැම්බර් | | | |
| ඔක්තෝම්බර් | | | |
| නොවැම්බර් | | | |
| දෙසැම්බර් | | | |

ඉහත සඳහන් විස්තර නිවැරදි බව සහතික කරමි.

දිනය :- ........................................

තනතුරු දරන්නාගේ අත්සන

බස්නාහිර පළාත් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක ........... හි 02 ඡේදයේ විධිවිධාන අනුව විශේෂ අවස්ථාවක් ලෙස සලකා නිලධාරියාට රු. ............................ අතිරේක ඉන්ධන දීමනාවක් ගෙවීම අනුමත කරමි.

........................................................

අමාත්‍යාංශ ලේකම්

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2014

මගේ අංකය:DMS/Cir/2014/COLA
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01
2014.01.06

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන්,

**2014 අයවැය යෝජනා අනුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා ව්‍යාපෘති කාර්ය මණ්ඩල සඳහා ජීවන වියදම් දීමනාව සංශෝධනය කිරීම**

01. 2014 අයවැය යෝජනා මගින් ප්‍රකාශිත ජීවන වියදම් දීමනාව ගෙවීම පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කළ යුතුය.

02. ඒ අනුව, පහත සඳහන් (i, ii හා iii) කාණ්ඩයන්ට ඇතුළත් නොවන, සියලුම රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල හා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 මගින් ආවරණය වන ව්‍යාපෘති කාර්ය මණ්ඩලය මෙම ගෙවීම සඳහා හිමිකම් ලබයි.

   i. සාමූහික ගිවිසුම් මගින් හෝ ඒ ආකාරයේ අවබෝධයකින් වැටුප් තීරණය කරනු ලබන ආයතන
   ii. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කොට ගත් විචල්‍ය ජීවනාධාර දීමනාවක් මාසිකව ගෙවනු ලබන ආයතන
   iii. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 මගින් කාර්ය මණ්ඩල හා අදාල වැටුප් තීරණය කරනු නොලබන ආයතන

03. <u>ජීවන වියදම් දීමනාව</u>

ඉහත අංක 02 හි පරිදි දැනට එම දීමනාව සඳහා සුදුසුකම් ලබන, හිමිකම් සහිත කාර්ය මණ්ඩලයට දැනට ගෙවනු ලබන මාසික ජීවන වියදම් දීමනාව 2014.01.01 දින සිට රු.7800/- ක් විය යුතුය.

04. <u>දෛනික වේතන මත සේවය කරන සේවකයින්ට දීමනා</u>

අනියම්/දෛනික වැටුප්ලාභී පදනම මත සේවය කරන සේවකයින්ට 2012.12.10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 48 හි 5.1 ඡේදය යටතේ වන දෛනික ජීවන වියදම් දීමනාව 2014.01.01 දින සිට රු. 260/- ක් වන සේ ගෙවිය යුතුය.

05. <u>සාවද්‍ය ගණනය කිරීම්</u>

මෙම චක්‍රලේඛයෙන් පරිබාහිරව කිසියම් තැනැත්තෙකුට මොනයම් හෝ වැඩිපුර මුදලක් ගෙවා ඇත්නම් ඒ පිළිබඳ ආයතනයේ මූල්‍ය කළමනාකරු/ ගණකාධිකාරී පෞද්ගලිකව වගකිව යුතු අතර, ගෙවා ඇති මුදල ආපසු ගෙවීමට එම තැනැත්තා බැඳී සිටී. එවැනි සාවද්‍ය වැටුප් පරිවර්තනයන් හෝ ගෙවීම් සිදුකරන වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගැනීමට අදාල බලධාරීන් ක්‍රියා කළ යුතු වේ.

පී.බී.ජයසුන්දර
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
4. විගණකාධිපති
5. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව
6. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය" 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்திமந்திரய", 32, ஸ்ரீமத் மார்க்கஸ் பர்னாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi" Mandiraya, 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

මගේ අංකය / எனது இல / My No
ඔබේ අංකය / உமது இல / Your No.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone 2698409
ෆැක්ස් / பெக்ஸ் / Fax 2694667

පොදු / பொது / General
දුරකථන / தொலைபேசி / Telephone 2691665, 2682868, 2698027, 2682869, 2682870

දිනය / திகதி / Date

## රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම පිණිස පත්කල කමිටුවේ රැස්වීම් වාර්තාව

දිනය - 2014.01.17

වේලාව - ප.ව. 2.00

කමිටු රැස්වීම ආණ්ඩුකාර ලේකම් ගේ ප්‍රධානත්වයෙන් පැවති අතර පහත සඳහන් නිලධාරීන් ඒ සඳහා සහභාගි විය.

| නිලධාරියාගේ නම | තනතුර | කාර්යාලය |
|---|---|---|
| සුනිල් අබේවර්ධන මයා | ආණ්ඩුකාර ලේකම් (බ.ප.) | ආණ්ඩුකාරලේකම්කාර්යාලය (බ.ප.) |
| හේමන්ත සමරකෝන් මයා | සභා ලේකම් | සභා ලේකම් කාර්යාලය (බ.ප.) |
| එන්.බන්දුල ප්‍රේමකුමාර මයා | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල) | ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.) |
| පී.සෝමසිරි මයා | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන) | ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.) |
| එන්. රණසිංහ මයා | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු) | ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.) |
| ආර්.එම්.එස්.බණ්ඩාරනායක මයා | සභාපති | මාර්ග සංවර්ධන අධිකාරිය (බ.ප.) |
| චම්පිකා පතිරණ මිය | අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක) | ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.) |
| ඩබ්.එල්.එන්.අයි.විජේසුන්දර මිය | අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) | ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.) |

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම පිණිස පත්කල කමිටුව පහත කරුණු පිළිබඳ තීරණ ගැනීම සඳහා 2014.01.17 වන දින රැස්විය.

01. <u>2012.11.13 දිනැති බස්නාහිර පළාත් ව්‍යාපාර චක්‍රලේඛ 01/2012 අවලංගු කර නව චක්‍රලේඛයක් නිකුත් කිරීම.</u>

2012.11.13 දිනැති බස්නාහිර පළාත් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2012 අනුව පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතනවල සභාපති,සාමාන්‍යාධිකාරි/අධ්‍යක්ෂකට ඉන්ධන සීමා නියම කර තිබුනි. එම තනතුරුවලට අමතරව තවත් ඊට පහල තනතුරු සඳහාද ඉන්ධන සීමා නියම කර දෙන ලෙස ඉල්ලමින් පළාත් මගී ප්‍රවාහන අධිකාරිය ඉදිරිපත් කර තිබූ ඉල්ලීම සලකා බැලූ 2013.12.26 දින රැස්වූ මෙම කමිටුව පහත පරිදි "නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි" තනතුර සඳහාද ඉන්ධන සීමා නියම කිරීමට අනුමැතිය ලබා දීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත නිර්දේශ කිරීමට තීරණය කර තිබුණි.

| | හිමිකම් දරණ තනතුර | පෙට්‍රල්/ඩීසල් වාහන සඳහා මාසිකව අනුමත කරන ඉන්ධන ලිටර් ප්‍රමාණය | ඉන්ධන සඳහා අනුමත උපරිම මාසික දීමනාව |
|---|---|---|---|
| 01 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති තනතුරු සඳහා පමණි) | 120 | මසකට අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය X මාසයේ පළමු දිනට පවතින ඉන්ධන මිල. |

එම තීරණය තහවුරු කිරීම මෙදින කමිටුව සලකා බැලූ අතර කමිටුව වෙත ඉදිරිපත් කර තිබූ කෙටුම්පත් චක්‍රලේඛය මෙහිදී සලකා බලන ලදී.නමුත් ඉන්ධන සීමා නියම කිරීමට අමතරව 01/2012 චක්‍රලේඛයේ සංශෝධනය කල යුතු කරුණු තව දුරටත් පවතින හෙයින් එම චක්‍රලේඛය අවලංගු කර පහත සංශෝධනද ඇතුලත්කර නව චක්‍රලේඛයක් නිකුත් කිරීම සුදුසු බව කමිටුවේ අදහස විය.

<u>2012.11.13 දිනැති බස්නාහිර පළාත් ව්‍යාපාර චක්‍රලේඛ 01/2012 හි කල යුතු සංශෝධනය.</u>

(අ). පළාත තුල රාජකාරී ගමන් සඳහා අතිරේක ඉන්ධන ලබා ගත නොහැකි බව බස්නාහිර පළාත් ව්‍යාපාර චක්‍රලේඛ 01/2012 හි සඳහන්ව තිබුනි. එය පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.
" කාර්යාලයෙන් දුර බැහැර විශේෂ වූ රාජකාරී ගමන් සඳහා අතිරේක ඉන්ධන ලබා ගත යුත්තේ නම්, ඒ සඳහා අදාල අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු අතර, අමාත්‍යාංශ ලේකම් විසින් ඒ සඳහා අනුමැතිය පෞද්ගලිකවම ලබා දිය වේ."

ඉහත තීරණය ගැනීමේදී කමිටුව විසින් පහත චක්‍රලේඛ හා ලිපි සැලකිල්ලට ගන්නා ලදී.

i. 1999.12.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 හා 1.1.6 හි v වන කාණ්ඩය.
ii. 2008.07.28 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED50.
iii. 2014.01.08 දිනැති නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන) ගේ අංක 1/පා/4/12 දරණ ලිපිය.

45

02. **2013.12.09 දිනැති කලමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2013(i) බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම.**

ඒ අනුව එහි දැක්වෙන යෝජිත ප්‍රසාද දීමනාව පළාත් සභාවට අදාල කර ගැනීම සුදුසු බව ගරු ආණ්ඩුකාරතුමා වෙත නිර්දේශ සඳහා ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී. කෙසේ වෙතත් මෙය ගරු ආණ්ඩුකාරතුමාට ඉදිරිපත් කිරීමට පෙර පළාත් සභාවේ අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතන වලට ආවේණික වූ විශේෂිත දිරිකාරක දීමනා ගෙවන්නේදැයි තොරතුරු විමසා බලා එම තොරතුරුද සමඟ ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කරන ලෙස කමිටු ලේකම්ට උපදෙස් දෙන ලදී.

03. **2014.01.06 දිනැති කලමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2014 බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම.**

මෙම චක්‍රලේඛය බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම කමිටුව විසින් නිර්දේශ කල අතර එය ගරු ආණ්ඩුකාරතුමා වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට තීරණය විය.

....................................
සුනිල් අබේවර්ධන,
ආණ්ඩුකාර ලේකම්.

....................................
එන්.බන්දුල ප්‍රේමකුමාර,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)

....................................
හේමන්ත සමරකෝන්,
සභා ලේකම්.

....................................
එන්.රණසිංහ,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)

....................................
පී.සෝමසිරි,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)

....................................
චම්පිකා පතිරණ,
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)

....................................
ආර්.එම්.එස්.බණ්ඩාරනායක,
සභාපති,
පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය.